# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,531—1958 සැප්තැම්බර් 25 වැනි බ්‍රහස්පතින්දා—25.9.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 827 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | 829 |
| සභාතුරු-ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... — | 829 | මාගී කොමිටි දැන්වීම ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... ... — | — | විවිධ දැන්වීම් ... — | — |


## පළාත් පාලන නිවේදන

ඇල් සී—බී. 22/53/ඇල්.ජී.ඩී—ජීජ් 11/17/5.

### 1950යේ අංක 19 දරණ විදුලි බලය පිළිබඳ ආඥාපනත

ගමනාගමනය හා කම්මාන්ත පිළිබඳ අමාත්‍යතුමාගෙන් විමසා පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් දෙන ලද අනුමැතිය ඇතුව නුවරඑළිය දිස්ත්‍රික්කයේ කඩවත් සතර ගම් ප්‍රදේශයේ ගම්කායයී සභාව විසින් 1950 අංක 19 දරණ විදුලි බලය පිළිබඳ ආඥාපනතේ 46 වන වගන්තිය යටතේ සම්පාදිතවූ නියෝග.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 සැප්තැම්බර් මස 16 වැනි දින,
කොළඹ.

**නියෝග**

1. මේ නියෝගවල—

"ආඥාපනත" යනුවෙන් 1950යේ අංක 19 දරණ විදුලි බලය පිළිබඳ ආඥාපනත අදහස් කරනු ලැබේ;

"බලපත්‍රය" යනුවෙන් ආඥාපනත යටතේ 2 වැනි වගන්තිය යටතේ නුවරඑළිය කඩවත් සතර ගම් ප්‍රදේශයේ ගම්කායයී සභාව වෙත නිකුත් කරන ලද බලපත්‍රය අදහස් කරනු ලැබේ;

"බලපත්‍රධාරියා" ඒ අනුව අදහස් කරගත යුතුය.

2. බලපත්‍රධාරියාගෙන් තම ප්‍රයෝජනය පිණිස විදුලි බලය ලබා ගැනීමට බලාපොරොත්තු වන ඕනෑම කෙනෙකු විසින්, විදුලි බලය ලබා ගැනීමට ඕනෑ කරන දිනට යටත් පිරිසෙයින් දවස් දහහතරකට වත් කලින්—

(අ) ඒ සඳහා බලපත්‍රධාරියා විසින් සම්පාදනය කර තිබෙන ෆෝර්මයේ ප්‍රකාරයට වියයුතු වූ ඉල්ලුම් පත්‍රයක් බලපත්‍රධාරියා වෙත ඉදිරිපත් කළ යුතුයි;

(ආ) විද්යුත් වේග වාහක ප්‍රධාන කම්බිය සවි කිරීම සඳහා වූ ගාස්තු බලපත්‍රධාරියාට කලින් ගෙවීම හෝ බලපත්‍රධාරියාට අවශ්‍ය නම් ආඥාපනතේ 33 වැනි වගන්තිය යටතේ බලපත්‍රධාරියා සමග ලියවිල්ලකින් වූ කොන්ත්‍රාත්තුවකට ඇතුලත් වීම කළ යුතුය.

3. විදුලි බලය පාවිච්චි කරන සෑම පාරිභෝගිකයකු විසින්ම බලපත්‍රයේ සඳහන් කරන ලද රේට් ගණන් අනුව එකී විදුලි බලය සඳහා මුදල් ගෙවිය යුතුය.

4. (1) පාරිභෝගිකයාට අයත් භූමිභාගයෙහි පිහිටුවා තිබෙන විද්යුත් වේග වාහක කම්බියේ කොටස හා විදුලි බලය වෙනස් කරන උපකරණද, ප්‍රධාන ගිනි නූල් සහ විද්යුත් මාපකයද, විදුලි යතුරු පුවරුවද බලපත්‍රධාරියා සතුව පවතින්නේය. බලපත්‍රධාරියා යටතේ රක්ෂාවෙහි නියුක්තවූවකු හැර වෙන කිසිම කෙනෙකු විසින් මොනම කාරණයක් සඳහාවත් එවා වෙනස් කිරීම හෝ අතපත ගෑම හෝ නොකළ යුතුයි.

(2) බලපත්‍රධාරියාගේ ප්‍රධාන ගිනි නූලේ හෝ විද්යුත් මාපකයේ තමාගේ පාර්ශවයේවූ යම් විදුලි කම්බි, වළලන ලද විදුලි කම්බි, හෝ වෙනත් විදුලි උපකරණ නඩත්තු කිරීම පිළිබඳ විදුලිය පාරිභෝගිකයා විසින් වග කිව යුතුය.

(3) ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කිරීමෙන් පසුව විදුලි බලය සවි කිරීම නැවත සම්බන්ධ කරන කල්හි එබඳු සවිකිරීම පරීක්ෂා කිරීමේ හා නැවත සම්බන්ධ කිරීමේ නියමිත ගාස්තු බලපත්‍රයේ සඳහන් කර ඇති පරිදි පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

(4) විදුලි බලය පාවිච්චි කරන කිසියම් පාරිභෝගිකයකුගේ විදුලි කම්බිවල හෝ සවිකිරීම්වල කිසියම් කොටසකින් විදුලි බලය කාන්දුවී යතොත් එකී විදුලිය පාරිභෝගිකයා විසින් ඔහුගේ ස්ථානයේ එසේ කාන්දුවී ගිය සියලුම විදුලි බලය සඳහා මුදල් ගෙවීමට යටත් විය යුතු වන්නේය.

5. (1) තමාගේ ස්ථානයට විදුලි බලය සැපයුවාට පසු යම්විටෙක යම්කිසි ලාම්පුවක් හෝ පංකාවක් හෝ එවකට පාවිච්චි කරන මීටරයකට වඩා විශාලවූ මීටරයක් පාවිච්චි කිරීමට හෝ වැඩිපුර යම්කිසි ලාම්පුවක් හෝ නිත්‍ය වශයෙන් හෝ තාවකාලික වශයෙන් විද්‍යුත් ප්‍රවාහයෙන් ක්‍රියාකරන උපකරණයක් සවිකිරීමට හෝ තමාගේ දේපලෙහි ඇද තිබෙන විදුලි කම්බි කොයි අන්දමකින් නමුත් වෙනස් කිරීමට හෝ දික් කිරීමට හෝ අදහස් කරන සෑම පාරිභෝගිකයකු විසින්ම තමාගේ අදහස එකී වෙනස් කිරීම හෝ දික් කිරීම පිළිබඳ කර්මාන්ත ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් දින දෙකකටවත් කලින් බලපත්‍රධාරියාට ලියවිල්ලකින් දැනුම්දිය යුතුවාත් හැර විදුලි කර්මාන්ත පිළිබඳ කොන්ත්‍රාත්කරුවකු ලවා ඒ වැඩය කර වීමට තමා අදහස් කරන්නේ නම් එකී කොන්ත්‍රාත්කරුවාගේ නම සහ ලිපිනයද බලපත්‍රධාරියා වෙත දැනුම්දිය යුතුයි.

(2) විදුලිය පාරිභෝගිකයකු විසින් කිසියම් දික් කිරීමක්, ලාම්පුවක්, පංකාවක් හෝ එවකට පාවිච්චි කරන මීටරයකට වඩා විශාලවූ මීටරයක් සම්බන්ධ කිරීම හෝ සම්බන්ධ කරවීම කිසියම් වැඩිපුර ලාම්පුවක් හෝ වෙනත් කිසියම් උපකරණ නිත්‍ය වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ ප්‍රධාන සවිකිරීමට සම්බන්ධ කිරීම එකී දික්කිරීම—ලාම්පුව, පංකාව, මීටරය, වැඩිපුර ලාම්පුව හෝ වෙනත් උපකරන සෝදිසිකොට හා පරීක්ෂාකොට බලා සතුටුවූයෙකයයි බලපත්‍රධාරියා විසින් ඒ සඳහා බලය දෙනලද නිලධාරියකු විසින් ඒත්තු ගතහොත් මිස නැත්නම් එසේ නොකළ යුතුය.

6. (1) කිසියම් ස්ථානයක බලපත්‍රධාරියාගේ ප්‍රධාන ගිනි නූල උනුවී යතහොත් පාරිභෝගිකයා විසින් ඒ බව බලපත්‍රධාරියාගේ විද්‍යුත් පාදකාගාරය හෝ උප විද්‍යුත් පාදකාගාරය භාරව සිටින නිලධාරිතුමා වෙත ඒ ඒ කාරණාවේ හැටියට වහාම දන්විය යුතුය.

(2) බලපත්‍රධාරියා විසින් බලය දෙනලද නිලධාරියකුට හෝ බලපත්‍රධාරියා විසින් සේවයෙහි යොදා ගෙන සිටින කිසියම් කම්කරුවකුට බාහිරවූ වෙනත් කිසිවකු විසින් බලපත්‍රධාරියාගේ දේපල වශයෙන් සැලකෙන කිසියම් උනුවී ගිය ගිනි නූලක් නැවත සවිකළ යුතු නැත.

(3) බලපත්‍රධාරියාගේ හෝ පාරිභෝගිකයාගේ දේපල වශයෙන් සැලකෙන ගිනිනූලක් නැවත සවි කිරිමට බලපත්‍රධාරියාගේ කිසියම් නිලධාරියකුගේ හෝ කම්කරුවකුගේ සේවය අවශ්‍යවූ විට ඒ සඳහා ගෙවිය යුතුවූ බලපත්‍රයේ සඳහන් නියමිත ගාස්තුව පාරිභෝගිකයාගේ එම මාසයේ ගණන් බිලවූ වලට ඇතුලත් කළ යුතුය.

7. සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් හෝ විදුලි බලය සැපයීමේදී සිදුවන බාධා හේතුකොටගෙන නියම වශයෙන් හෝ අනියම් වශයෙන් සිදුවිය හැකි පාඩුවක් හෝ අලාභ හානියක් සම්බන්ධයෙන් බලපත්‍රධාරියා විසින් පාරිභෝගිකයාට වග කියනු නොලැබේ.

8. ආඥාපනතේ 45 වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කොට තිබුණාවූ සේවයක් නැවත සම්බන්ධ කරන කල්හි එය පරීක්ෂා කොට බලා නැවත සම්බන්ධ කිරීම සඳහා බලපත්‍රයේ සඳහන් පරිදි ගාස්තුවක් අය කළ යුතුවාත් හැර පාරිභෝගිකයා විසින් එය කලින් ගෙවිය යුතුද වන්නේ ය.

9. (1) සියලුම ගාස්තු ගනුදෙනු ඉදිරිපත් කරන දිනයට අයවිය යුතුව තිබෙන්නා සේ සලකනු ලැබේ.

(2) ගණුදෙනු පිළිබඳවූ යම් පැමිණිල්ලක් එකී ගණුදෙනු ඉදිරිපත් කොට සතියක් ඇතුළතදී කරන ලද්දේ නම් මිස නැත්නම් ගණුදෙනුවල වැරදි පිළිබඳවූ කිසිම පැමිණිල්ලක් බලපත්‍රධාරියා විසින් භාරගනු නොලැබේ.

10. (1) තමාගේ ස්ථානය සඳහා විදුලි බලය සැපයීම අවශ්‍ය නොවන සෑම පාරිභෝගිකයකු විසින්ම ඒ පිළිබඳ දින තුනක ලියවිල්ලකින්වූ දැන්වීමක් බලපත්‍රධාරියා වෙත දිය යුතුය.

(2) 1 වැනි ඡේදයේ සඳහන් පරිදි එසේ දැන්වීමක් කර නොමැති කල්හි පරිභෝගිකයාට විදුලි බලය අවශ්‍ය බව දන්වමින් බලපත්‍රධාරියාට දැන්වීම ලැබුණ දින සිට දවස් තුනක් ගතවනතුරු ඒ ස්ථානයේ වූ බලපත්‍රධාරියාගේ විදුලිය උපකරණ සඳහා පාරිභෝගිකයා වගකිය යුතුවාත් හැර එහි පාවිච්චි කරන්නට යෙදුන සියලු විදුලි බලය සම්බන්ධයෙන් ගාස්තුද ගෙවිය යුතුය. එහෙත් එකී දවස් තුන අවසාන වන්නට මත්තෙන් බලපත්‍රධාරියා විසින් සේවය අසම්බන්ධ කරන ලද්දේ නම් ඒ ස්ථානයේ පාවිච්චි කරන ලද විදුලි බලය සම්බන්ධයෙන් පාරිභෝගිකයා වගකිව යුත්තේ එසේ අසම්බන්ධ කාල වේලාව දක්වා පමණකි.

11. (1) කිසිම පාරිභෝගියකු විසින්—

(අ) බලපත්‍රධාරියාගේ ප්‍රධාන විද්‍යුත් වේග වාහක කම්බියට සම්බන්ධ කිරීමට අදහස් කරන පාරිභෝගිකයාගේ කිසියම් දේපලක පිහිටි අලුත් විදුලි කර්මාන්ත සඳහා කම්බි ඇදීම හෝ උපකරණ සවිකිරීම හෝ සම්බන්ධයෙන් කිසිම වැඩක් කරගෙන යෑම; හෝ

(ආ) කිසියම් ස්ථානයක විදුලි බලය සැපයීම පිළිබඳවූ උපකරණ බලපත්‍රධාරියාගේ විද්‍යුත් වේගවාහක කම්බියට සම්බන්ධ කළාට පසු.

(1) එකී විදුලි බලය සැපයීම පිළිබඳවූ උපකරණ සවිකිරීම හෝ ඒවා වෙනස් කිරීම, හරිගැස්සීම අමුතු කිරීම හෝ අලුත්වැඩියා කිරීම යනාදියෙන් සමන්විතවූ, හෝ

(2) එබඳු සවිකිරීමක ස්වභාවය හා ප්‍රමාණයට කිසිම ආකාරයකින් හානි නොවන්නාවූ පරිද්දෙන් සාමාන්‍ය වශයෙන් ලාම්පු, පංකා, විදුලි යතුරු හෝ සේවයට අවශ්‍ය වෙනස් කොටස් දැමීමෙන් බාහිරවූ කිසිම විදුලි කර්මාන්තයක් කිරීම හෝ කරගෙන යාම හෝ, සඳහා—

(අ) විදුලි කර්මාන්තය පිළිබඳ කටයුතු භාරගැනීමට අවශ්‍ය දක්ෂතාවය හෝ විදුලිය කටයුතු පිළිබඳ පිළිගත් කර්මාන්තශාලාවක හෝ ව්‍යාපාරික ස්ථානයක හෝ විද්‍යුත් පාදකාගාරයක කටයුතු කිරීමෙන් යටත් පිරිසෙයින් අවුරුදු තුනක වත් පළ පුරුද්දක් හෝ තිබේය කියා ප්‍රධාන ඉංජිනේරුවා විසින් හා ආණ්ඩුවේ විදුලිය කටයුතු දෙපාර්තමේන්තුවේ කළමනාකාරයා විසින් සහතික කරනු ලැබූවාවූ; හා

(ආ) විදුලිය පිළිබඳ ඉංජිනේරු කර්මාන්තයෙහි අවුරුදු දෙකකට වඩා අඩුනොවූ කාලසීමාවක් නිතිපතා සේවයෙහි යෙදී සිටියාවූ කිසියම් කෙනෙකුට බාහිර වශයෙන්වූ වෙනත් කෙනෙකු යොදවා ගත යුතු නැත.

(2) (1) වැනි ඡේදයේ විස්තර කරන ලද කිසියම විදුලි කර්මාන්තයක් සමග සම්බන්ධවූ කිසියම් සවිකිරීමක් එකී ඡේදයේ සඳහන් කෙනෙකුට බාහිරවූ වෙනත් කිසියම් කෙනෙකු විසින් හෝ එබඳු කෙනෙකුගේ වැඩ කරුවකු විසින් හෝ බලපත්‍රධාරියාගේ ප්‍රධාන විද්‍යුත් වේග වාහක කම්බියට සම්බන්ධ නොකළ යුතුයි.

12. (1) යෝජනාකර තිබෙන කර්මාන්තය බලපත්‍රධාරියාගේ නිලධාරියකුට පරීක්ෂා කිරීමට හැකිවන පරිද්දෙන් ඒ පිළිබඳ දවස් දෙකකට අඩුනොවූ දින ගණනකට කලින් දැනුම් දීමෙන් පසුව මිස එවකට සවිකොට තිබෙන විදුලි කම්බි යන්ත්‍ර සූත්‍ර උපකරණ ආදිය වෙනස් කිරීම හෝ ඒවාට අමුතුවෙන් යමක් එකතු කිරීම හෝ ඒවා හරිගැස්සීම හෝ විදුලි කම්බි යන්ත්‍ර සූත්‍ර උපකරණ ආදිය සවිකිරීම වැනිවූ කිසිම විදුලි කර්මාන්තයක් හෝ කරගෙන යාම නොකළ යුතුයි.

(2) යෝජනාකර තිබෙන කර්මාන්තය ඒ නිලධාරියා අනුමත කරහොත් ඔහු විසින් විද්‍යුත් මාපකය සවිකරන ස්ථානය ගැන කොන්ත්‍රාත්කාරයා සමග සමථයකට පැමිණිය යුතුවාත් හැර ආඥාපනතේ 60 වැනි වගන්තිය යටතේ සම්පාදිත නියෝගවලට අනුකූලව ඔහු විසින් ඒ කර්මාන්තය කරගෙන යායුතු වන්නේ ය.

13. (1) 12 වැනි නියෝගයේ සඳහන් කිසියම් විදුලි කර්මාන්තයක් අවසාන කිරීමෙන් පසුව බලපත්‍රධාරියා විසින් ඒ සඳහා බලය දෙනලද නිලධාරියකු විසින් එකී කර්මාන්තය පරීක්ෂාකොට නිවැරදියයි සෝදිසි කළ යුතුය—

(අ) විදුලි කම්බි ආදිය සවිකිරීම නියමිත වූ නියෝගවලට එකඟව පවත්නේ නම් ඒ ස්ථානයට විදුලි බලය සැපයීම කරනු ලැබේ;

(ආ) විදුලි කම්බි ආදිය සවිකිරීම නියමිත වූ නියෝගවලට එකඟව නොපවත්නේ නම් විදුලි කම්බි ආදිය සවිකිරීම එකී නියෝගවලට එකඟවන පරිද්දෙන් සකස් කරන තුරු ඒ ස්ථානයට විදුලි බලය සපයනු නොලැබේ.

(2) මේ නියෝගය යටතේ කිසියම් විදුලි කර්මාන්තයක් පරීක්ෂාකොට නිවැරදියයි සෝදිසිකොට බැලීම පිණිස ගෙවිය යුතු ගාස්තුව පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

14. බලපත්‍රධාරියාට දැන්වීමක් නොකොට හෝ ඔහුගේ අනුමතිය කලින් ලබා නොගෙන හෝ අළුතෙන් විදුලි උපකරණ සවිකිරීමක් සම්බන්ධයෙන්වූ යම් වැඩක් යම් ස්ථානයක කරගෙන යන්නේ නම් බලපත්‍රධාරියා විසින් ඒ ස්ථානයට විදුලි බලය සැපයීම ප්‍රතික්ෂේප කළ හැකිය. එසේ නැතහොත්, අවශ්‍ය යයි බලපත්‍රධාරියා අදහස් කරන පරිද්දෙන් විදුලි කම්බි ඇද තිබෙන හැටි වෙනස් කිරීමට හෝ අමුතු කිරීමට හෝ බලපත්‍රධාරියා විසින් ඒ සඳහා බලය දෙනලද නිලධාරියාට පුළුවන. එකී වෙනස් කිරීම හෝ අමුතු කිරීම් විධිමත් පරිදි කර තිබේ නම් එකී නිලධාරියා විසින් විදුලි කම්බි, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ආදිය නැවත පරීක්ෂාකොට නිවැරදියයි සෝදිසිකොට බලා නියම පිළිවෙලට ඒවා සවිකොට ඇති බව පෙනී ගියහොත් එකී ස්ථානයට විදුලි බලය සපයනු ලැබේ.

15. බලපත්‍රධාරියා වෙත කලින් කරන ලද දැන්වීමක් නැතිව, හෝ ඔහුගේ අවසරය නොමැතිව බලපත්‍රධාරියාගේ විද්‍යුත් වේග වාහක කම්බියට දැනට සම්බන්ධකර තිබෙන්නාවූ කිසියම් විදුලිය කම්බි ආදියක් විදුලිය කටයුතු පිළිබඳ යම් කොන්ත්‍රාත් කරුවකු විසින් දික් කරනු ලැබුවහොත් එවිට එකී විදුලි කර්මාන්තය සම්පූර්ණයෙන් බලපත්‍රධාරියාගේ විද්‍යුත් වේග වාහක කම්බියෙන් අසම්බන්ධ කිරීමට යටත් වන්නේ ය.

16. යම් විදුලි කර්මාන්තයක් නැවත සම්බන්ධ කිරීම සඳහාවූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම බලපත්‍රධාරියා විසින් ඒ සඳහා සපයනු ලබන ෆෝර්මයේ ප්‍රකාරයට විය යුතුවාත් හැර විදුලි බලය සැපයීමේ අවශ්‍ය කත්වයට පැය 48කට මත්තෙන් එය බලපත්‍රධාරියාගේ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

## 1946යේ අංක 57 දරන පළාත් පාලනය (පාලන කොට්ඨාශ) පිළිබඳ ආඥාපනත

ඉහළ මධ්‍යම කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්වර එච්. ඒ. පී. අභයවර්ධන මහතා, ඔහුගේ රාජකාර්යය පිළිබඳ කටයුතු වලට අමතර වශයෙන්, 1958 වේ සැප්තැම්බර් මස 15 වැනි දින සිට, යළිත් නියම කරනතුරු, පහළ මධ්‍යම කොට්ඨාසයේ ද පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා වශයෙන් වැඩ බැලීම පිණිස රාජ්‍යසේවා කොමිෂන් සභාව විසින් පත් කරන්ට යෙදුණා ඇත.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
වැඩ බලන පළාත් පාලන කොමසාරිස්.

1958 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

---

## 1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනත

1952 කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥා පනතේ 3 වෙනි වගන්තිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ අධිකාරි පත්තුවේ ගම් ප්‍රදේශයේ ගම් කාරක සභාව විසින් සම්මත කරගන්නා ලද පහත දැක්වෙන යෝජනා එකී වගන්තියේ ප්‍රකාර මෙහි පහත පළ කරණු ලැබේ:

යෝජනාව

පළාත් පාලනය පිළිබඳ අමාත්‍ය වරයා විසින් සම්පාදනය කරණ ලද්දාවූ සෙනේට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් සම්මත කරණ ලද බව 1953 අගෝස්තු මස 7 වෙනි දින අංක 10, 560 දරණ ගැසට් පත්‍රයේ පලවූ නිවේදන යෙන් ප්‍රකාශ කරන ලද්දාවූ පොදු අතුරු ව්‍යවස්ථා වල I, III, V, VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI XVII, XIX, XX, XXII, XXIII, XXIV, XXV, XXVI, XXVII, XXX, XXXI. XXXIII, XXXIV, XXXV, XXXVI සහ XXXVII, වැනි කාණ්ඩයන් මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවනදා සිට සම්මත කරගැනීමට අධිකාරි පත්තුවේ ගම් ප්‍රදේශයේ ගම් කාරක සභාව විසින් 1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥා පණතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙසින් යොජනා කරනු ලැබේ.

ඩී. සී. ඩබ්ලිව්. කන්නන්ගර,
ප්‍රධාන තැන.

වර්ෂ 1958ක්වූ අගෝස්තු මස 25 වැනි දින,
බංඩාරගම අධිකාරි පත්තුවේ ගම්සභා කාර්යාලයේදිය.

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්. සී.—බී. 141/46.
ඇල්. ජී. සී.—ජී. අයි 11/30ඩී.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර බටහිර ගම්පහ කෝරලේ ගම් ප්‍රදේශයේ උඩදුම්බර ගම්කාරක සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරන ලද එකී වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 සැප්තැම්බර මස 12 වැනි දින,
කොළඹදීය.

අතුරු ව්‍යවස්ථාව

1957 තේ දෙසැම්බර මස 20 වැනි දින අංක 11,221 දරණ ගැසට් පත්‍රයේ පළකරණලද අප්‍රසන්නවූ හා අන්තරායදායකවූ කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථාව පහත සඳහන් පරිදි මෙසින් සංශෝධනය කරනු ලැබේ. එනම් :—

(1) එහි (අ) අක්ෂරය දරණ ඡේදයෙහි, "දුම්කොළ වියලා සකස් කිරීම" යන කාරණය එක්කම ඊළඟට පහත සඳහන් අනිත් කාරණ යෙදීමෙනි :—

"කොම්පෝස්ට් හෝ කෘත්‍රිම පොහොර සෑදීම;
ලැලි පොහොර සකස් කිරීම;
සුරුට්ටු සෑදීම;
බීඩි සෑදීම;
රා එකතුකරණ ස්ථානයක් තබා ගැනීම;
කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීම සඳහා පාවිච්චි කරණ ද්‍රව්‍ය ගෝනි හුනකට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම."

(2) එහි (ආ) අක්ෂරය දරණ ඡේදයෙහි, "තේ කර්මාන්ත ශාලාවක් තබාගැනීම" යන කාරණය එක්කම ඊළඟට පහත සඳහන් අනික් කාරණ යෙදීමයි :—

"පිදුරු ගබඩා කිරීම;
සෝඩා, ලැමනේඩ් ආදී සිසිල් බීම වගී ගබඩා කිරීම;
කාබොක්, ගල් හෝ බොරළු ලබා ගැනීම පිණිස වළක් කැණීම."
හා

(3) එහි (ඇ) අක්ෂරය දරණ ඡේදයෙහි, "කෙඳිවගී සායම්කිරීම" යන කාරණය එක්කම ඊළඟට පහත සඳහන් අළුත් කාරණය යෙදීමෙනි :—

"බැටරි චාජ් කිරීම."

---

ඇල්.සී.—බී. 13/58
ඇල්.ජී.සී.—ජීඅයි 11/65ඒ

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ වවුනියා දිස්ත්‍රික්කයේ සින්නසෙට්ටිකුලම් නැගෙනහිර සහ බටහිර (සිංහල කොට්ඨාසයේ) ගම් ප්‍රදේශයේ ගම්කාරකසභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලනය සහ සංස්කෘතික පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද ව්‍යවස්ථාව.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 සැප්තැම්බර් 12 වැනි දින,
කොළඹ.

අතුරු ව්‍යවස්ථාව

කර්මාන්තයක් වශයෙන් හාල් මෝලක් තබා ගැනීම අන්තරාදායක කර්මාන්තයක් ලෙස සළකනු ලැබේ.

---

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ

### කොලොන්නාව නගර සභාව

**1957 වර්ෂයේ අයවැය වාර්තාව**

| ආදායම් | | | මුදල රු. ශ. |
|---|---|---|---|
| (ඒ) පොදු අය | | | |
| වරිපනම් ... | ... | ... | 1,68,428 02 |
| රථවාහන හා සත්වයන්ගේ බද්ද | | ... | 3,303 50 |
| බලපත්‍ර, අවසරපත්‍ර බද්ද | ... | ... | 55,879 35 |
| විවිධ ආදායම් | ... | ... | 1,62,977 53 |
| ආපසුගෙවීම් සහ ආධාර | ... | ... | 36,625 84 |
| (බී) මාර්ග/පාරවල් | ... | ... | 3,510 44 |
| (සී) අම්බලම් සහ නානායම් | ... | ... | — |
| (ඩී) පළාත් ආණ්ඩුසභාවට අයත් බිම් සහ ගොඩනැගිලි ... | ... | ... | 29,951 30 |
| (ඊ) මහජන සෞඛ්‍ය | | | |
| 1. සාමාන්‍ය | ... | ... | — |
| 2. පාර ශුද්ධ කිරීම සේවය | | ... | — |
| 3. කසලශෝධක සේවය ... | | ... | 4,040 00 |
| 4. සූනාගාරය සහ ගවකොටුව | | ... | — |
| 5. වතුර සැපයීම | ... | ... | 142 50 |
| 6. ආරෝග්‍යශාලා | ... | ... | 11,150 00 |
| 7. වෙළඳ පොලවල් | ... | ... | — |
| 8. වසංගතරෝග | ... | ... | — |
| (ඇෆ්) මහජන විනෝදය | ... | ... | 2,364 40 |
| (ජී) සොහොන්පලවල් | ... | ... | 225 00 |
| (එච්) සුනඛයින් ලියා පදිංචි කිරීම | ... | ... | 46 50 |
| (අයි) කිරුම් සහ මිනුම් ගාස්තු | ... | ... | 289 65 |
| (ජේ) විදුලි බල දෙපාර්තමේන්තුව | ... | ... | 1,77,936 54 |
| | | මුළු එකතුව ... | 6,56,870 57 |

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| තැන්පත් කිරීම් ... ... | 33,669 57 | |
| අත්තිකාරම් ... ... | 53,239 57 | |
| 1.1.57 දිනට ඉතිරි ... ... | 2,93,694 41 | |
| | | 3,80,603 55 |
| එකතුව ... | | 10,37,474 12 |

## කොළොන්නාව නගර සභාව

| වියදම් | මුදල රු. ශ. |
|---|---|
| (ඒ) පොදු වියදම් | |
| වැටුප් සහ විශ්‍රාම වැටුප් ... ... | 53,959 58 |
| ආයතන වියදම් ... ... | 36,017 67 |
| ආපසු ගෙවීම ... ... | 1,077 50 |
| දයක මුදල් සහ ආධාර මුදල් ... | 8,760 50 |
| (බී) මාර්ග/පාරවල් | |
| අත්කර ගැනීම ... ... | 34,253 61 |
| වැඩිදියුණු කිරීම ... ... | 2,034 93 |
| ණය සඳහා ගෙවිය යුතු මුදල් ... | — |
| මිනීම ... ... ... | 10,124 30 |
| අනෙක් වියදම් ... ... | 53,535 05 |
| (සී) අම්බලම් සහ තානායම් වලට ... ... | — |
| (ඩී) පලාත් ආණ්ඩු සභාවට අයත් බිම් සහ ගොඩ නැගිලි ... ... | 25,676 54 |
| (ඊ) මහජන සෞඛ්‍ය | |
| 1. සාමාන්‍ය ... ... | 27,031 15 |
| 2. පාර ශුද්ධ කිරීම ... ... | 42,528 91 |
| 3. කසල ශුද්ධ කිරීම ... ... | 1,10,293 55 |
| 4. සූතාගාරය සහ ගවකොටුව ... | — |
| 5. ජල සැපයීම ... ... | 42,156 20 |
| 6. ආරෝග්‍ය ශාලා ... ... | 53,335 55 |
| 7. වෙළඳ පොලවල් ... ... | — |
| 8. වසංගතවලට වියදම් ... ... | 192 10 |
| (ඇෆ්) මහජන විනෝදය ... ... | 2,024 55 |
| (ජී) සොහොන්පලවල් ... ... | 1,989 31 |
| (එච්) සුනඛයින් ලියා පදිංචි කිරීම ... ... | — |
| (අයි) කිරීම් සහ මැනීම ... ... | 208 09 |
| (ජේ) විදුලිය දෙපාර්තමේන්තුව ... ... | 1,49,339 67 |
| එකතුව ... | 6,54,538 76 |

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| තැන්පත් මුදල් ... ... | 22,226 17 | |
| අත්තිකාරම් ... ... | 1,16,476 51 | |
| 31.12.57 දිනට ඉතිරි ... ... | 2,44,232 68 | |
| | | 38,29,935 36 |
| එකතුව ... | | 10,37,474 12 |

කොලොන්නා නගර සභාවේ සභාපති වන සී. අමරසිංහ වන මා මගේ දැනීමේත්, විශ්වාසයේත් හැටියට මෙහි යඳහන්ව ඇත්තේ 1957 වර්ෂයේ කොලොන්නා නගර සභාවේ සත්‍යවූත්, නිවැරදිවූත් අයවැය වාර්තාවක් බව මෙයින් සහතික කර සිටිමි.

සී. අමරසිංහ,
සභාපති.

1958 අප්‍රියෙල් 26 වැනි දින,
කොලොන්නා නගර සභා කාර්‍යාලයේදිය.
වැල්ලම්පිටිය.

නිවැරදි බව සහතික කරමි.

සී. පෙරේරා,
සගික.

වර්ෂ 1958 ක්වූ අප්‍රියෙල් මස 26 වෙනි දින කොලොන්නාවේදී මා ඉදිරිපිට සහතික කළ බවට.

කේ. ටී. ජී. පෙරේරා,
සමාදාන විනිශ්චය කාර තැන.

## 1957 දෙසැම්බර් මස 31 වෙනි දිනට මෙම නගර සභාවේ වටිනාකම සහ නගර සභාවෙන් ගෙවීමට ඇති ණය ගනුදෙනුවල වාර්තාව

| ගෙවීමට ඇති ණය ගනුදෙනු | | | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත් මුදල් ... ... ... | | | 73,544 20 |
| කසල කාණු ක්‍රමය සඳහා ආධාර ... ... | | | 3,50,000 00 |
| ජලනල ක්‍රමය සඳහා ආධාර ... ... | | | 3,30,000 00 |
| වටිනාකම අඩුවීම වෙනුවෙන් වෙන් කළ මුදල ... | | | 3,000 00 |
| 1956 දෙසැම්බර් 31 වෙනි දිනට වැඩිපුර ... | | 2,08,429 30 | |
| 1957 වර්ෂයේ ආදායම ... | 6,56,870 57 | | |
| 1957 වර්ෂයේ වියදම ... | 6,54,538 76 | | |
| | | 2,331 81 | |
| | | | 2,10,761 11 |
| | | | 9,67,305 31 |

වටිනාකම

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| අත්තිකාරම් ... ... ... | | 68,072 63 |
| ස්ථිර තැන්පත් ... ... ... | | 1,35,000 00 |
| අත්තිකාරම් කසල කාණු ක්‍රමය සඳහා ප්‍රසිද්ධ සෞඛ්‍ය ඉංජිනේරු තුමා ... ... ... | | 2,50,000 00 |
| අත්තිකාරම් කසල නාශක ක්‍රමය සඳහා ප්‍රසිද්ධ සෞඛ්‍ය ඉංජිනේරු තුමා ... ... ... | | 2,70,000 00 |
| අතේ ඉතිරි මුදල් ... | 2,001 06 | |
| අතේ ඇති චැක්පත් ... | 785 77 | |
| සුළු ගනුදෙනු සඳහා අතේ ඇති මුදල් ... ... | 100 00 | |
| අංක 1 බැංකු ගනුදෙනු ඉතිරි ... | 2,48,245 78 | |
| අංක 2 බැංකු ගනුදෙනු ඉතිරි ... | 2,258 38 | |
| බැංකුවේ තැන්පත්වී නොමැති මුදල් ... ... | 368 89 | |
| | 2,53,759 88 | |
| මාරු නොකළ චැක්පත් ... | 9,583 48 | |
| | 2,44,176 40 | |
| බැංකුවට අය කරන ලද කොමිස් මුදල ... ... | 75 | |
| | 2,44,177 15 | |
| ආණ්ඩුව වෙනුවෙන් බැංකුව අය කරන බදු මුදල් ... | 64 09 | |
| | 2,44,241 24 | |
| 14.11.57 දින වැඩියෙන් තැන් පත්කළ මුදල ... | 63 | |
| | 2,44,240 61 | |
| චැක්පත් සඳහා බැංකුව වැඩි යෙන් අයකළ මුදල ... | 8 00 | |
| | 2,44,232 61 | |
| 10.12.57 වෙනි දින අඩුවෙන් තැන්පත් කළ මුදල ... | 10 | |
| | 2,44,232 71 | |
| බැංකුවේ වැඩිපුර තැන්පත්වී ඇති මුදල් ... | 03 | |
| | | 2,44,232 68 |
| | | 9,67,305 31 |

කොලොන්නා නගර සභාවේ සභාපති වන සී. අමරසිංහ වන මා මගේ දැනීමේත් විශ්වාසයේත් හැටියට මෙහි ඉහතින් සඳහන්ව ඇත්තේ 1957 දෙසැම්බර් මස 31 වැනි දිනට මෙම නගර සභාවෙන් ගෙවීමට ඇති ණය ගනුදෙනුවල සත්‍යවූත් නිවැරදිවූත් වාර්තාවක් බව මෙයින් සහතික කර සිටිමි.

සී. අමරසිංහ,
සභාපති.

1958 අප්‍රියෙල් 26 වෙනි දින,
කොලොන්නා නගර සභා කාර්‍යාලයේදිය.

නිවැරදි බවට සහතික කරමි.

සී. පෙරේරා,
සගික.

වර්ෂ 1958 ක්වූ අප්‍රියෙල් මස 26 වෙනි දින කොලොන්නාවේදී මා ඉදිරිපිට සහතික කළ බවට.

කේ. ටී. ජී. පෙරේරා,
සමාදාන විනිශ්චය කාර තැන.

කොලොන්නාවේ නගර සභාවේ සභාපති තැන විසින් සපයන ලද එම නගර සභාවේ 1957 තේ ගිණුම් මාගේ විධානය යටතේ පරීක්ෂාකරන ලදී.

2. එම වර්ෂය තුළදී ගෙවා ඇති මුදල් අතුරෙන් රු. 13,800.00, රු. 1,176.20 සහ රු. 480.00 යන මුදල් ප්‍රමාණ නීත්‍යානුකූලදැයි තවමත් පරීක්ෂණයට භාජනය වී තිබේ.

3. ඉහත සඳහන් කාරණය සහ මෙම ගිණුම් පිළිබඳ එහි සභාපති තැනට ඉදිරිපත් කෙරෙන වාර්තාවේ කියමනාවල් වලට යටත්ව, 1957 දෙසැම්බර් 31 වෙනි දින තෙක් කොලොන්නාවේ නගර සභාවේ වැඩකටයුතු පිළිබඳව වත්කම් සහ බැරකම් ප්‍රකාශය සත්‍යවූත් සාධාරණවූත් තත්වයක් පෙන්වන බව මාගේ අදහසයි.

ඩී. ඇස්. ඩී. සිල්වා,
වැඩබලන ඔඩිටර් ජනරාල්.

1958 සැප්තැම්බර් මස 18 වැනි දින කොළඹ 7 හේ ගණන් පරීක්ෂක කාර්යාලයේදිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී